සාකච්ඡාවට ගනු ඇත. මේ *සඳහා ශ්‍රී ලංකා ජාතික වානිජ මණ්ඩලය නියෝජනය* කරමින් ර් එම් විජේතිලක මයා , *ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය* මහ *ලේකම් සහභාගී වීමට නියමිතයි. එදින දිස්ත්‍රික් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංගම් වෙතින් ජාතික වාණිජ මණ්ඩලය වෙත ඉදිරිපත් වු සාමජිකයින්ගේ ඉඩම් සම්බන්ධ ගැටළුද සමුළුවට ඉදිරිපත් කරනු ඇත. ඒමෙන්ම ජාතික වාණිජ මණ්ඩලයේ* නියෝජිත මහතා සමග අදාල සාම්ජිකයින්ටද සමුළුවට සහභාගී වමිට අවස්තාව සලසා ඇත.

ඔබට අවශ්‍ය ඕනැම සේවාවක් පිළිබද වැඩි විස්තර සදහා

| | | | |
|---|---|---|---|
| පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථානය, | - | නිරෝෂ් ඒකනායක | : 689597 |
| අන්තර්ජාල පහසුකම් / ර් මේල් සම්බන්ධතාවය | - | උපුල් රත්නායක | : 689597 |
| වෙළද ලියකියවිලි, | - | තිස්ස රූබේරු | : 689598 |
| අපනයන සංඛ්‍යා දත්ත | - | අජිත් සේනාරත්න | : 689598 |

වෙනත් තොරතුරු

| | |
|---|---|
| ර්.එම් විජේතිලක (ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය මහ ලේකම්) | : 689805 |
| මාලිකා බේරුගොඩ (නියෝජ්‍ය මහ ලේකම්) | : 689600 |
| මල්කා සුදර්ශනී | : 689805 |

වලින් හෝ පහත දුරකථන අංක වලින් අමතන්න
075-374801-3, 075-374805-7,

සියළු විමසීම් සඳහා අමතන්න


ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය
අංක 450 , ඩි.ආර් විජේවර්ධන මාවත, කොළඹ 10
දුරකථන: 01-689600 ,689597, 689805, 075374801-3, 075-374805-7
ෆැක්ස් 689596
ර්මේල් sme@nccsl.lk
වෙබ් : www.sme.nccsll.lk



දායකත්වය : මල්කා සුදර්ශනී ,අජිත් සේනාරත්න


# FASME News
# පුවත්


*වෙළුම 01* *කළාපය 5* *නොවැම්බර් 2003*

ශ්‍රී ලංකා ජාතික වාණීජ මණ්ඩලයේ ප්‍රකාශනයකි


**ශ්‍රී ලංකා ජාතික වාණීජ මණ්ඩලය වෙතින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරික ඔබට .....**

## *සේවා හා පහසුකම් - Services & Facilities*

## ශ්‍රී ලංකා ජාතික වාණීජ මණ්ඩලය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සදහා වෙබ් පහසුකම් ලබා දෙයි.
## NCCSL launches Web Portal for SMEs




"ශ්‍රී ලාංකික ව්‍යාපාරික ප්‍රජාවට සේවා හා සහය සපයන ප්‍රමුඛතම ආයතනය බවට පත්වීම " යන තම ඉදිරි දර්ශනය ක්‍රියාවට නැංවීම සඳහා ශ්‍රී ලංකා ජාතික වාණීජ මණ්ඩලය විසින් 2003 නොවැම්බර් 7 වන දින ප.ව. 4.00 ට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වෙනුවෙන් වෙබ් පෝටල් සේවාවක් **(Web Portal)** ආරම්භ කෙරිය.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සදහා වෙබ් පහසුකම් ලබා දීමේ අරමුණ වන්නේ තොරතුරු තාක්ෂනය හරහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට වෙළද අවස්ථා වර්ධනය කර ගැනිමට සහය වීමයි.මෙම වෙබ් පෝටල් (Web Portal) තුල සැම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය දිස්ත්‍රික් සංගමයකටම ඔවුන්ගේම වෙබ් පිටුවක් ලැබෙයි. මෙහි සංගම් වල විස්තර ඇතුලත් කර ඇත. මෙම සංගම් ශ්‍රී ලංකා ජාතික වාණීජ මණ්ඩලයට අනුබද්ධිත ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක සංගම් සම්මේලනයේ සාමාජික ආයතනයන්ය.

මීට අමතරව තෝරාගත් දිස්ත්‍රික්ක 5 කින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක සංගම් සාමාජිකයින්ගේ ව්‍යාපාර විස්තර ප්‍රදර්ශනය කිරීමට ඒ ඒ දිස්ත්‍රික් සංගම් වල වෙබ් අඩවි තුල ඉඩ සලසා ඇති අතර ඒ තුල ව්‍යාපාරයේ විස්තර , ජායාරූප සහිතව නිෂ්පාදන වල විස්තර ප්‍රදර්ශණය කරනු ඇත. වෙබ් පිටුවක් හිමි වී ඇති සෑම ව්‍යාපාරිකයකුටම වෙනම ඊ මේල් ලිපිනයක් ලබා දී ඇත. එසේම මෙම වෙබ් සේවාව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට නව වෙළඳ පළ සොයා ගැනීමට හා ඔවුන්ගේ ව්‍යාපාර සංවර්ධනයට විශාල පිටුවහලක් වෙයි.

අනාගතයේදී මෙම වෙබ් පෝටල් සේවාව (Web Portal) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ ජාතික වෙබ් පෝටල් සේවය ලෙස වර්ධනය කිරීමට නියමිතයි. මෙම වෙබ් සේවාව තුලින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ ව්‍යාපාර ප්‍රවර්ධනයට ඉතා ඉහල දායකත්වයක් ලැබෙනු ඇතැයි ශ්‍රී ලංකා ජාතික වාණජ මණ්ඩලයේ විශ්වාසයයි.

## *සාමාජික පුවත් - Members News*

### දනුෂා මරින් ලංකා " TOYP 2003" සම්මානයෙන් පිදුම් ලබයි
### Danusha Marine Lanka won the "TOYP 2003"

දනුෂා මරින් ලංකා ආයතනයේ කළමණාකරන අධ්‍යක්ෂක ජී එස් ප්‍රනාන්දු මහතා මේ *වසරේ* "The Outstanding Young Persons " "TOYP 2003" සම්මානයෙන් පිදුම් ලැබිය. ඔහු ඒ සඳහා *තේරී පත් වී ඇත්තේ* ව්‍යවසායකත්ව නිපුනතාවය සඳහා වන අතර මෙම *සම්මානය පිරිනමනු ලබන්නේ* Junior chamber ආයතනය විසින්

ෆයිබර් ග්ලාස් *බෝට්ටු , බලවේග* බෝට්ටු, හබල් , ඩිංගී බෝට්ටු , හබල් *බෝට්ටු යනාදී විවිධ නිෂ්පාදන දනුෂා මරින් ආයතනයේ* නිෂ්පාදන වේ.

ජී එස් ප්‍රනාන්දු මහතා ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලයට අනුබද්ධිත ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංගම් සම්මේලනයේ සාමාජිකත්වය දරන අතර ඔහු සු.ම.ව්‍ය. සංගමය - කළුතර දිස්ත්‍රික්කයේ සභාපතිත්වය උසුලයි. එමෙන්ම ඔහු කළුතර දිස්ත්‍රික්කයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක ප්‍රජාවට ඉතා විශිෂ්ඨ නායකත්වයක් ලබා දෙයි.

ඉතාමත් සුළු මට්ටමේ සිට සිය ව්‍යවසායකත්ව හැකියාව ඔස්සේ මේ *වන විට ඔහු ඉතා ඉහල දියුණුවක් අත් කරගෙන* සිටියි. සිය ව්‍යවසායකත්ව හැකියාව සඳහා ඔහු *අත්කර ගෙන ඇති මෙම සාර්ථකත්වය පිළිබදව ශ්‍රී ලංකා ජාතික වාණිජ මන්ඩලයේ මෙන්ම ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාන ව්‍යවසාය සංගම් සම්මේලනයේ උනුසුම්* සුභ පැතුම් ...........

## පුත්තලම දිස්ත්‍රික්කයේ සු.ම.ව්‍ය. සංගමයේ මහ සභා රැස්වීම පැවැත්වෙයි.
## AGM of Association of SMEs – Puttalm District

පුත්තලම් සු.ම.ව්‍යවසාය සංගමයේ මහා සභා රැස්වීම පසුගිය ඔක්තොබර් මස වෙන්නප්පුව වෙරෝනා -හෝටලයේදී පැවැත්විනි. එදින සංගමිය සඳහා නව නිළධාරි මඩුල්ලක් තෝරා පත් කර ගැනිනි. එදින පත් වු නව නිළධාරි මණ්ඩලය මෙසේයි. K F J M *පෙරේරා* මයා, සභාපති, J N *පෙර්රා මයා. උප සභාපති, අනෝජා* ජයසිංහ මිය,ලේකම්, සමින්ත මේදිස් මියා සම් ලේකම්, රොෂාන්ත *පෙරේරා* මයා, භාන්ඩාගාරික, ඩඩ්ලි ප්‍රනාන්දු , ලලිත් පීරිස් , ලලිත් කිත්සිරි, නිමිල් *පෙරේරා*, ශාන්ත යාපා, උදය පද්මි කුමාර , ලාල් සිල්වා , අජිත් පීරිස්, නෙලුමාල් පීටර්ස් යන මිහත්වරු කමිටු සාමාජිකයින් ලෙස තේරි පත් විනි. ගරු අනුශාසක ධුරය සඳහා ජෝර්ජ් *පෙරේරා මහතා තේරි පත් විනි.*

සංගමියේ සියළු නිළදාරි මිහත්මි මිහත්මින්ගේ සහය ඇතිව පුත්තලම් දිස්තත්‍රික්කයේ සුළු හා මිධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ සුභසිද්ධිය උදෙසා පුත්තලම් දිස්ත්‍රික්කය තල ක්‍රියාත්මික වන ප්‍රධානතම් ආයතන බවට පත් විම් තම් සංගමියේ අරමුණ බව K F J M පෙර්රා මිහතා පැවැසිය.සංගමයේ අනාගත කටයුතු සාර්තකව කිරිමට නව නිළධාරි මන්ඩලයට අපගේ සුභ පැතුම් .........

## අනුරාධපුර සු. ම .ව්‍ය සංගමයේ නව නිළධාරි මඩුල්ලක්
## New Council Members elected for Association of SMEs – Anuradhapura

අනුරාධපුර දිස්ත්‍රික්කයේ සු.ම.ව්‍ය.සංගමයේ මහා සභා රැස්වීම අනුරාධපුර සංචාරක *හෝටල් තානායම්* රැස්විම් ශාලාවේදී පැවැත්විනි. එදින ප්‍රධාන ආරධිතයා වශයෙන් කාර්මික සංවර්ධන මිණ්ඩලයේ සභාපති අචාර්ය බන්දුල පෙර්රා මිහතා සහභාගි විය.

W N L *ෆොන්සේකා* (සභාපති), *කේ ටී එච් ගුණස්කර ( ලේකම්) , A R ඉන්ද්‍රසේන* (භාන්ඩාගාරික) ,ඉනෝකා දිල්රුක්සි (උප ලේකම් ) J L සුරවිර (විගනන පරික්ෂක) යන මහත්ම මහත්මින් නව නිළධාරි මඩුල්ල ලෙස තේරි පත් විනි. නව නිළධාරි මණ්ඩලයට ඉදිරි කටයුතු සාර්ථකව කර ගෙන යාමට අපගේ සුභ පැතුම් .........

## *විවිධ පුවත් - General News*

## කර්මාන්ත කරුවන්ගේ සමුළුවක්
## Industrialist Forum

කර්මාන්තකරුවන් ගැටළු සම්බන්ධව සාකච්ජා කරන කර්මාන්තකරුවන්ගේ මිලග සමුළුව 2003 *නොවැම්බර් 12 වන බදදා කර්මාන්ත අමාත්‍යංශයේ* ශ්‍රවණාගාරයේදී පැවැත්විම්ට කටයුතු *යොදා ඇත. එදින සුළු හා මධ්‍ය පරිමාන ව්‍යවසායකයින්ගේ* ඉඩම් සම්බන්ධ ගැටළුද